# කොවිඩ් 19 සති පාසල (2021) - සබරගමුව

(නිවිතිගල අධ්‍යාපන කලාපය)

විෂය -විද්‍යාව ශ්‍රේණිය-09 සතිය 01

## මාතෘකාව-ක්ෂුද්‍ර ජීවීන්ගේ භාවිත

පාඩම- ක්ෂුද්‍ර ජීවීන්

*මෙම පාඩම අවසානයේ දී ඔබ

- ලක්ෂණ නිරීක්ෂණය කර බැක්ටීරියා,දිලීර, ප්‍රොටොසෝවා සහ ඇල්ගී ලෙස ක්ෂුද්‍ර ජීවීන් නිදසුන් සහිතව කාණ්ඩ කරයි.
- ජීවී අජීවී අතරමැද ලක්ෂණ සහිත කාණ්ඩයක් ලෙස වෛරස් හදුනා ගනී.
- වෛරස් සජීවී සෛල තුල පමණක් ගුණනය වන බවත් සෛලීය සංවිධානයක් නොමැති බවත් ප්‍රකාශ කරයි.
- ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ තුල ඒක සෛලික හා බහු සෛලික ක්ෂුද්‍ර ජීවීන්ද සිටින බව ප්‍රකාශ කරයි.
- ආන්තික පරිසර තත්ව යටතේද ක්ෂුද්‍ර ජීවීන්ට ජීවත් විය හැකි බව ප්‍රකාශ කරයි.
- ක්ෂුද්‍ර ජීවීන් වැඩෙන සුවිශේෂී උපස්ථර ලෙස මස්, මාළු, පලතුරු, මිනිස් සම, මුඛය, ආහාර මාර්ගය, ප්‍රජනක අවයව සහ පස නම් කරයි.

*පළමුව 9 ශ්‍රේණියේ පෙළ පොතේ I කොටස හි පිටු අංක 01 කියවා පහත ප්‍රශ්ණ වලට හරි නම් √ ලකුණද වැරදිනම් × ලකුණද යොදන්න.

1. ක්ෂුද්‍ර ජීවීන් තනි සෛලයකින් හෝ සෛල කීපයකින් ගොඩ නැගී ඇත. ( )
2. ක්ෂුද්‍ර ජීවීන් පියවි ඇසට පැහැදිලිව නොපෙනේ. ( )
3. අප අවට පරිසරයේද දේහය තුලද ක්ෂුද්‍ර ජීවීන් දක්නට නැත. ( )
4. බොහෝ ක්ෂුද්‍ර ජීවීන් මිනිසාට, අනෙකුත් සත්වයන්ට හා ශාක වලටද හිතකර වේ. ( )
5. ක්ෂුද්‍ර ජීවීන් අහිතකර තත්ත්ව දරයි. ( )
6. පෘතුවිය මත වෙසෙන ජීවීන් අතරින් පුළුල්ව ව්‍යාප්තිය ඇත්තේ ක්ෂුද්‍ර ජීවීන් හටය. ( )
7. ක්ෂුද්‍ර ජීවීන්ගේ වර්ධනය හා ප්‍රජනනය ඉතා වේගවත්ය. ( )
8. විවිධ පරිසර වලට හා පෝෂණ ක්‍රම වලට ක්ෂුද්‍ර ජීවීන් අනුවර්තනය (හැඩ ගැසීම) වේ. ( )

9. ප්‍රධාන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩ ලෙස වෛරස,බැක්ටීරියා, දිලීර, ඇල්ගී හා ප්‍රොටොසෝවා දැක්විය හැක. ( )
10. ජීවී හා අජීවී අතරමැදි ලක්ෂණ පෙන්වන ක්ෂුද්‍ර ජීවී කාණ්ඩයක් ලෙස වෛරස් දැක්වේ. ( )

* ඉන්පසුව පිටු අංක 02,03 කියවා 1.1 වගුව සකස් කර ක්ෂුද්‍ර ජීවීන් කාණ්ඩ වල ලක්ෂණ හා නිදසුන් අධ්‍යනය කරන්න ( මදක් විශාල කොලයක සකස් කර නිතර දර්ශණය වන ස්ථානයක තබා ගන්න)

* ක්ෂුද්‍ර ජීවීන් ජීවත් වන පරිසර හා උපස්ථර ලියන්න.

❖ **අමතර දැනුමට -**

වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් මෙම සබැඳිය ඔස්සේ පිවිසෙන්න.
https://microbiologysociety.org/why-microbiology-matters/what-is-microbiology.html